සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 2025
Third Term Test - 2025

10 ශ්‍රේණිය | **කෘෂි හා ආහාර තාක්ෂණය - I** | **කාලය පැය 03 යි**

අමතර කියවීම් කාලය මිනිත්තු 10 යි.

නම/ විභාග අංකය:

i. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
ii. 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැළපෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

01. වැවක වැව් බැම්මට ජලය මගින් ඇතිවන පීඩනය අවම කරමින් වාරි ජලය මූදා හැරීම සඳහා ඉදිකරන ලද සුවිශේෂී නිර්මාණයකි,
(1) සොරොව්ව (2) බිසෝකොටුව (3) සලපනාව (4) දියකැට පහණ

02. ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදනට වැඩිම දායකත්වයක් සපයන්නේ කෘෂිකාර්මික අංශයෙහි,
(1) පශු සම්පත් මඟිනි. (2) වතු සංවර්ධනය මඟිනි.
(3) බෝග වගාව මඟිනි. (4) ධීවර් කර්මාන්තය මඟිනි.

03. සුළඟේ වේගය මනිනු ලබන ඒකකය වන්නේ,
(1) පැයට කිලෝමීටර් ය. (2) තත්පරයට මීටර් ය.
(3) පැයට මීටර් ය. (4) තත්පරයට සෙන්ටිමීටර් ය.

04. රූපයේ ඇති උපකරණය මගින් මනිනු ලබන්නේ,


(1) ආලෝකය ලැබෙන කාලසීමාව යි.
(2) ආලෝකය තීව්‍රතාව යි.
(3) ආලෝකයේ ගුණාත්මය යි.
(4) ආලෝක සංවේදීතාව යි.

05. වායුගෝලීය උෂ්ණත්වය ඉහළයාම පාලනයට කෘෂිකාර්මිකව සිදුකළ හැකි ක්‍රියාකාරකමක් වනුයේ,
(1) වගා කළ හැකි සෑම තැනකම බෝග වගා කිරීමයි.
(2) වැව් ඉදිකර කැලෑ හෙලිපෙහෙලි කර වගාබිම් ඇති කිරීමයි.
(3) කෘෂි රසායනික ද්‍රව්‍ය භාවිතය අවම කරමින් හේන් ගොවිතැනෙහි නිරත වීමයි.
(4) නව වන වගා හා කෘෂි වන වගා ඇතිකිරීමයි.

06. ශ්‍රී ලංකාවේ කෘෂි දේශගුණික කලාප අතුරෙන් DL ලෙස සංකේතවත් කරන්නේ,
(1) උඩරට තෙත් කලාපයයි. (2) මැදරට අතරමැදි කලාපයයි.
(3) පහතරට තෙත් කලාපයයි. (4) පහතරට වියළි කලාපයයි.

07. ප්‍රභා අවධි අසංවේදී ශාක පමණක් අඩංගු පිළිතුර තෝරන්න.
(1) අර්තාපල්, පොල් හා මිරිස් (2) පොල්, මිරිස් හා නව වී ප්‍රභේද
(3) ලීක්ස්, බීට් හා කැරට් (4) බටු, ස්ට්‍රෝබෙරි හා දුම්කොළ

08. පහත සඳහන් පාෂාණ අතුරෙන් විපරිත පාෂාණ ලෙස ගැනෙන්නේ,
(1) ක්වාට්ස් හා ග්‍රැනයිට් ය. (2) හුණුගල් හා වැලි ගල් ය.
(3) නයිස් හා කිරිගරුඬ ය. (4) පෙග්මටයිට් හා ෂෙල් ය.

09. පාෂාණ භෞතික ජීර්ණය සඳහා බලපාන සාධකයක් <u>නොවන්නේ</u> මින් කුමක් ද?
(1) ජලය මිදීම (2) වන ගහණය
(3) උෂ්ණත්වය වෙනස් වීම (4) ගලායන ජලය

Past Papers Wiki

10. පාංශු පැතිකඩක රූපසටහනක් මෙහි දක්වා ඇත. එහි පාංශු ගැඹුර ලෙස හැඳින්වෙන කාලප වන්නේ,



(1) C හා R කලාපයන් ය.
(2) B, C හා R කලාපයන් ය.
(3) A, B හා C කලාපයන් ය.
(4) A, B, C හා R කලාපයන් ය.

11. ක්ෂාරීයතාවයට පත් වූ පසක් උදාසීන කිරීම සඳහා එකතු කළ හැකි ද්‍රව්‍යයක් වන්නේ,
(1) ඩොලමයිට් ය. (2) ජිප්සම් ය.
(3) කැල්සියම් කාබනේට් ය. (4) කැල්සියම් ඔක්සයිඩ් ය.

12. ශිෂ්‍යයෙක් රෝල් ක්‍රමයට පසෙහි වයනය සෙවීම සඳහා පස් සාම්පලයක් ගෙන ජලය එක්කර ගුලියක් සකසා එය රෝල් කිරීමට යාමේදී කැඩී ගියේ නම්, එම පස,
(1) මැටි පසකි. (2) වැලි පසකි. (3) මැටි ලෝම පසකි. (4) වැලි ලෝම පසකි.

13. බෝග වර්ග කිහිපයක් හා ඒවා අයත්වන ශාක කුල පහත වගුවේ දී ඇත. ඒවායින් කුල අනුව නිවැරදිව බෝග සඳහන් කර ඇති පිළිතුර තෝරන්න.

	මැල්වේසියේ	සොලනේසියේ	පොඒසියේ
(1)	බණ්ඩක්කා	බටු	ගෝවා
(2)	මුං	මිරිස්	ඉඳල් ඉඟුරු
(3)	කජු	කරවිල	වී
(4)	බණ්ඩක්කා	අර්තාපල්	බඩ ඉරිඟු

14. බෝග වර්ගීකරණයේ වැදගත්කම පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A - විවිධ බෝග සඳහා බිම් සැකසීමේ ක්‍රම තීරණය කිරීමට වැදගත්වේ.
B - විවිධ ශාක කුල අතර බද්ධ කිරීමේදී ඒවා සාර්ථක කරගැනීමට වැදගත්වේ.
C - ශාක පිළිබඳ අධ්‍යයනය කිරීමේ පහසුව සඳහා වැදගත්වේ.
ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වනුයේ,
(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) B හා C පමණි. (4) A, B හා C යන සියල්ලම.

15. වැටි හා කානු පාත්ති සකස් කිරීමේදී යොදා ගන්නා උපකරණයකි,
(1) හැඩලැලි නඟුල (2) ජපන් පරිවර්ත්‍ය නඟුල (3) රිජරය (4) ටූල් කැරියර්

16. රූපයේ දැක්වෙන බිම් සැකසීමේ උපකරණය යොදාගන්නේ,



(1) පැළ අවට පස් එකතු කිරීම සඳහාය.
(2) පස සමඟ පොහොර මිශ්‍ර කිරීම සඳහාය.
(3) පැළ අවට වල් මර්ධනය කිරීම සඳහාය.
(4) පස බුරුල් කිරීම සඳහාය.

17. බෝග සංස්ථාපන උපකරණ භාවිතය පිළිබඳ නිවැරදි පිළිතුර තෝරන්න.
(1) ගතවන කාලය හා ශ්‍රමය අඩුකර ගත හැකිය.
(2) බීජ වලට යාන්ත්‍රික හානි සිදුවිය හැකිය.
(3) රෝපණ ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් අවශ්‍ය වේ.
(4) පාංශු ජීවීන්ට හානි සිදුවිය හැකිය.

18. කෙසෙල් වගාව සඳහා තනි වගා වලක් සැකසීමේ දී වලේ ප්‍රමාණය වන්නේ,
(1) 90 x 90 x 90 cm ය. (2) 60 x 60 x 60 cm ය. (3) 45 x 45 x 45 cm ය. (4) 30 x 30 x 30 cm ය.

19. කුඩා ගෙවතු සඳහා මිරිස් පැළ අලෙවිකිරීමට යොදාගත හැකි වඩාත් සුදුසු තවාන් ක්‍රමය වන්නේ,
(1) උස් තවාන් ය. (2) නොරිදෝකෝ තවාන් ය.
(3) තැටි තවාන් ය. (4) බඳුන් තවාන් ය.

20. රූපයේ සඳහන් තවාන් පාත්තිවල A හා B මිනුම් වලට වඩාත් නිවැරදි පිළිතුර වන්නේ,



(1) A - 90 cm, B - 30 cm ය.
(2) A - 1 m, B - 15 cm ය.
(3) A - 1 m, B - 30 cm ය.
(4) A - 90 cm, B - 15 cm ය.

21. බීජ තවාන් දමා පැළ සිටුවීමෙන් ලැබෙන වාසි කිහිපයක් පහත දැක්වේ.

A - තවාන් දමා සිටුවන පැළ රෝග පළිබෝධ හානිවලට හොඳින් ඔරොත්තු දෙයි.

B - තවාන් දමා පැළ සිටුවීමෙන් ඒකාකාරී වගාවක් ලබා ගත හැකිය.

C - කුඩා කාලයේ හොඳින් රැකබලාගන්නා නිසා දිරිමත් ශාක ලබා ගත හැකිය.

ඉහත ප්‍රකාශ වලින් සත්‍ය වනුයේ,

(1) A හා B ය. (2) B හා C ය. (3) A හා C ය. (4) A, B හා C සියල්ලම ය.

22. තවාන් දමා සිටුවන බීජ ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) කරවිල, පතෝල, මාලුමිරිස් හා බණ්ඩක්කා

(2) වට්ටක්කා, මිරිස්, රාබු හා බටු

(3) තක්කාලි, බණ්ඩක්කා, මිරිස් හා රාබු

(4) බටු, මිරිස්, තක්කාලි හා ගෝවා

23. පසෙහි මතුපිට පෘෂ්ඨයෙන් ජලය වාෂ්ප ලෙස ඉවත්ව යාම,

(1) උත්ස්වේදනය යි. (2) මතුපිට අපදාවය යි. (3) වාෂ්පීකරණය යි. (4) ගැඹුරු වැස්සීමයි.

24. බෝග වලට ජලය සම්පාදනයේ දී සැලකිය යුතු කරුණු කිහිපයක් පහත දී ඇත.

A - වගාකර ඇති බෝග වර්ගය B - බෝගයේ වර්ධන අවස්ථාව C - පසේ වයනය

ඉහත කරුණු අතුරෙන් නිවැරදි වනුයේ,

(1) A හා B ය. (2) A හා C ය. (3) B හා C ය. (4) A, B හා C සියල්ලම ය.

25. රූපයේ ඇති ජල සම්පාදන ක්‍රමය වන්නේ,



(1) වළලු ජලසම්පාදනය යි.

(2) බේසම් ජලසම්පාදනය යි.

(3) හීවිටි ජලසම්පාදනය යි.

(4) තීරු ජලසම්පාදනය යි.

26. ඉසින ජල සම්පාදනයේ අවාසියක් වන්නේ,

(1) සුලඟ අධික ප්‍රදේශවල වාෂ්පීකරණයෙන් ජලය අපතේ යාමයි.

(2) බෑවුම් සහිත ඉඩම් වලට නුසුදුසු වීමයි.

(3) වැඩි ජල ප්‍රමාණයක් අවශ්‍ය වීමයි.

(4) ජල සම්පාදන කාර්යක්ෂමතාවය අඩුවීමයි.

27. රූපයේ ඇති ජලවහන කානු රටාව වන්නේ,



(1) සමාන්තර කානු ය.

(2) ග්‍රිඩ් අයන් කානු ය.

(3) හෙරින් බෝන් කානු ය.

(4) කොඩොල් කානු ය.

28. වායුගෝලයෙන් හා පසෙන් ලබාගන්නා අත්‍යාවශ්‍ය මහා පෝෂකය නම්,

(1) කාබන් ය. (2) හයිඩ්‍රජන් ය. (3) නයිට්‍රජන් ය. (4) ඔක්සිජන් ය.

29. පොස්පරස් මූල ද්‍රව්‍ය මඟින් ශාක දේහය තුළ ඉටුවන කෘත්‍ය වන්නේ,

(1) ශාක වර්ධනයට වැදගත් වීම යි.

(2) මූල පද්ධතියේ වර්ධනයට වැදගත් වීම යි.

(3) පුෂ්පීකරණයට වැදගත් වීම යි.

(4) ශාකය තුළ එන්සයිම ක්‍රියාකාරීත්වයට වැදගත් වීම යි.

30. පොල් පොහොර වල අඩංගු ලා දුඹුරු පැහැති, ජලයේ අද්‍රාව්‍ය, ස්ඵටික රූපී පොහොර වර්ගය වන්නේ,

(1) ඇමෝනියම් සල්ෆේට් ය. (2) ත්‍රිත්ව සුපර් පොස්පේට් ය.

(3) රොක් පොස්පේට් ය. (4) මියුරියේට් ඔෆ් පොටෑෂ් ය.

31. කාබනික පොහොර පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - දිගු කාලයක් තිස්සේ අඩු වේගයකින් පසට පෝෂක නිදහස් කරයි.

B - අඩංගු පෝෂක ප්‍රමාණය අඩු බැවින් විශාල ප්‍රමාණ වලින් යෙදිය යුතුය.

C - ගබඩා කර තැබීමට විශාල ඉඩක් අවශ්‍ය නොවේ.

ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වනුයේ,

(1) A හා B පමණි. (2) A හා C පමණි.

(3) B හා C පමණි. (4) A, B හා C යන සියල්ලම.

32. අර්ධ පොහොර මිශ්‍රණයක් සඳහා උදාහරණයක් වන්නේ,

(1) පොල් වගාවේ පැළ පොහොර මිශ්‍රණය යි.

(2) වී වගාවේ බණ්ඩි පොහොර මිශ්‍රණය යි.

(3) එළවළු වගාවේ මූලික පොහොර මිශ්‍රණය යි.

(4) වී වගාවේ මූලික පොහොර මිශ්‍රණය යි.

33. ආක්‍රමණශීලී වල්පැළෑටි පමණක් අඩංගු පිළිතුර තෝරන්න.

(1) ගඳපාන, ගිරාපලා හා කළාඳුරු

(2) ගිනි තෘණ, නෙරෙංචි හා දිය හබරල

(3) ඇටෝරා, උඳුපියලි හා යෝධ නිදිකුම්බා

(4) පානීතියම්, විඩෙලියා හා පිලිපීන් ෆයර්වර්ක්

34. පූර්ව නිර්ගමන වල්නාශක පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - වල් පැළෑටි පොළොවෙන් උඩට මතු වූ පසු පත්‍ර මතට ඉසිනු ලැබේ.

B - බීම් සැකසීමේදී පසට යොදනු ලැබේ.

C - වල් පැළෑටි පොළොවෙන් උඩට මතුවීමට පෙර ඒවා විනාශ කරයි.

මෙය අතුරෙන් සත්‍ය ප්‍රකාශය වනුයේ,

(1) A හා B පමණි. (2) A හා C පමණි.

(3) B හා C පමණි. (4) A, B හා C සියල්ලමය.

35. දිලීර හා බැක්ටීරියා රෝග වල පොදු ලක්ෂණයක් <u>නොවන්නේ,</u>

(1) අංගමාරය යි. (2) ශාක කුරුවීම යි. (3) පුල්ලි ඇතිවීම යි. (4) මැලවීම යි.

36. ඇන්ත්‍රැක්නෝස් රෝගයේ රෝග කාරක දිලීර විශේෂය වන්නේ,

(1) කොලෙටෝට්‍රිකම් ය. (2) පීතියම් ය. (3) ෆියුසේරියම් ය. (4) සියුඩොමොනාස් ය.

37. සුහුඹුලා හා කීටයා යන දෙදෙනාම හානි පමුණුවන පළීබෝධකයෙකු වන්නේ,

(1) ගොයම් මකුණා ය. (2) පුරුක් පණුවා ය.

(3) ඉල්මැස්සා ය. (4) අවුලකපෝරා කුරුමිණියා ය.

38. මාස $3\frac{1}{2}$ ක වී ප්‍රභේදයක වර්ධක අවධි කාලය වන්නේ,

(1) දින 30 කි. (2) දින 45 කි. (3) දින 60 කි. (4) දින 75 කි.

39. වී ප්‍රභේදයක විශේෂ ලක්ෂණයක් හා එහි වයස දැක්වෙන වගුවක් පහත දී ඇත. එහි නිවැරදි තොරතුරු ඇතුළත් පේළිය තෝරන්න.

	වී ප්‍රභේදය	විශේෂ ලක්ෂණය	වයස
(1)	H4	කොළ පාළු රෝගයට ඔරොත්තු දෙයි	මාස $3\frac{1}{2}$
(2)	Bg 450	නාඩු සහල් වර්ගයකි	මාස $4\frac{1}{2}$
(3)	Bg 300	දුඹුරු පැළ නීඩෑ හානියට තරමක් ඔරොත්තු දෙයි	මාස 3
(4)	Bg 351	සම්බා සහල් වර්ගයකි	මාස $3\frac{1}{2}$

40. වී වගාව සඳහා වසරකට වරක් මූලික පොහොර සමඟ යෙදීමට නිර්දේශ කර ඇති ක්ෂුද්‍ර පෝෂ්‍ය අඩංගු පොහොර වර්ගය වන්නේ,

(1) සින්ක් සල්ෆේට් ය. (2) කොපර් සල්ෆේට් ය.

(3) මැග්නීසියම් සල්ෆේට් ය. (4) බොලමයිට් ය.

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 2025
Third Term Test - 2025

10 ශ්‍රේණිය

කෘෂි හා ආහාර තාක්ෂණය - II

නම/ විභාග අංකය:

- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 20 යි. තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් හිමි වේ.**

---

(01) දේශගුණික හා පාංශු සාධක වල මෙන්ම බිම් සැකසීමේ සිට සිදු කරනු ලබන වගා නඩත්තු කටයුතුවල සාර්ථකත්වයෙන්, බෝග නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා ඍජුවම බලපායි.

i. හරිත විප්ලවය සමඟ කෘෂිකර්මාන්තයේ සිදුවූ වෙනස්කම් හතරක් ලියන්න.

ii. පරිසර උෂ්ණත්වය, ප්‍රදේශය අනුව වෙනස්වීම කෙරෙහි බලපාන සාධක හතරක් ලියන්න.

iii. පසක ව්‍යුහය විනාශවන ආකාර හතරක් ලියන්න.

iv. පාංශු බාදනය නිසා සිදුවිය හැකි අහිතකර ප්‍රතිඵල 04 ක් ලියන්න.

v. ප්‍රාථමික බිම් සැකසීමේදී සිදුකෙරෙන කාර්යයන් දෙකක් හා ඒ සඳහා භාවිතා කෙරෙන යාන්ත්‍රික උපකරණ දෙකක් ලියන්න.

vi. රෝපණ ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා තවාන් භාවිතා කිරීමේ වාසි හතරක් ලියන්න.

vii. උප පෘෂ්ඨීය හෙවත් භූගත ජල සම්පාදන ක්‍රමයේ වාසි හතරක් ලියන්න.

viii. ශාකයක පෙන්වන පොස්පරස් ඌනන ලක්ෂණ හතරක් ලියන්න.

ix. කෘමි රූපාන්තරණ ආකාර දෙක සඳහන් කර ඒවාට උදාහරණ ලෙස වී වගාවේ පළිබෝධකයින් දෙදෙනෙකු නම් කරන්න.

x. නව වැඩිදියුණු කළ වී ප්‍රභේදයක ලක්ෂණ හතරක් ලියන්න.

(02) පාරිසරික සාධක හා ඒවායේ හැසිරීම පිළිබඳව පූර්ව අවබෝධයකින් සිටීම බෝග වගා කටයුතු සඳහා ප්‍රයෝජනවත් වේ.



i. a) රූපයේ A, B හා C ලෙස නම් කර ඇති දේශගුණික කලාප නම් කර ඒවාට අදාල වාර්ෂික වර්ෂාපතන ප්‍රමාණයන් ලියා දක්වන්න.

b) ඉහත දේශගුණික කලාප අතුරෙන් වැඩිම කෘෂි පාරිසරික කලාප ගණනක් අයත් වන්නේ කුමන කලාපයකට ද? එම ගණන කොපමණ ද?

ii. a) ශ්‍රී ලංකාවට වර්ෂාව ලැබෙන ප්‍රධාන ක්‍රම මොනවා ද?

b) වර්ෂාපතයේ හිතකර බලපෑම් තුනක් ලියන්න.

iii. a) ආලෝක තීව්‍රතාව මැනීම සඳහා භාවිතා කරන උපකරණය නම් කරඑහි ඒකකය සඳහන් කරන්න.

b) බෝග වගාව කෙරෙහි සාපේක්ෂ ආර්ද්‍රතාවයේ අහිතකර බලපෑම් හතරක් ලියන්න.

(03) කෘෂි කර්මාන්තයේදී බෝග වගා කෙරෙන උපස්තරය හෙවත් පස මඟින් සුවිශේෂී කාර්යයන් කිහිපයක් සිදුවේ.

i. a) පාෂාණ වලින් පස නිර්මාණය වීමේ ක්‍රියාවලිය සරළ සටහනකින් ලියා දක්වන්න.
   b) පසේ අඩංගු ඛනිජ වර්ග තුනක් ලියන්න.

ii. a) පාංශු වාතයේ වැදගත්කම් තුනක් ලියන්න.
   b) පාංශු තෙතමන මට්ටම් අනුව සංතෘප්ත පසක පවතින ජල ආකාර මොනවා ද?

iii. a) පසේ භෞතික ලක්ෂණ හතරක් ලියන්න.
   b) පාංශු ජීවීන්ගේ වැදගත්කම් හතරක් ලියන්න.



(04) ශාක රෝපණ ද්‍රව්‍ය මනාව පසේ සංස්ථාපනය වීමට නම්, ඒ සඳහා සුදුසු පරිදි පසේ භෞතික තත්ත්වය සකස්කිරීම වැදගත් වේ.

i. a) රූපයේ ඇති උපකරණය කුමක් ද?
   b) මෙම උපකරණය භාවිතා කරන්නේ කුමන බිම් සැකසීමේ පියවර සඳහා ද?
   c) අතුරුයත් ගෑම යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද?
   d) අතුරුයත් ගෑමේ ක්‍රියාකාරකම් දෙකක් සඳහන් කරන්න.

ii. a) තවානක් සඳහා සුදුසු ස්ථානයක් තේරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු තුනක් ලියන්න.
   b) තවාන් ජීවානුකරණය කරන ක්‍රම තුනක් සඳහන් කරන්න.

iii. a) තවානක් සඳහා සුදුසු ස්ථානයක් තේරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු තුනක් ලියන්න.
   b) තවාන් ජීවානුහරණය කරන ක්‍රම තුනක් සඳහන් කරන්න.

(05) බෝග වගාවේදී බීජ ප්‍රරෝහණයේ සිට අස්වනු නෙළාගන්නා අවස්ථාව දක්වාම ඉතාමත් වැදගත් සාධකයක් වන්නේ ජලය යි.

i. a) පාංශු ජල සංරක්ෂණ ක්‍රම දෙකක් ලියන්න.
   b) පිටාර ජල සම්පාදනයේ වාසි හතරක් ලියන්න.

ii. a) කාර්යක්ෂම හා සූක්ෂම ජල සම්පාදන ක්‍රම දෙකක් සඳහන් කරන්න.
   b) ඔබ ඉහත සඳහන් කළ ජල සම්පාදන ක්‍රම වල පොදු අවාසි තුනක් ලියන්න.

iii. a) ජල වහනය යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?
   b) දුර්වල ජලවහනය නිසා ඇතිවන ගැටලු හතරක් ලියන්න.

(06) උසස් අස්වැන්නක් ලබාගැනීම සඳහා බෝග වල පෝෂණය පිළිබඳව සැලකිලිමත්වීම අත්‍යවශ්‍ය වේ.

i. a) බෝග වලට අත්‍යාවශ්‍ය ක්ෂුද්‍ර පෝෂක මූලද්‍රව්‍ය හතරක් නම් කරන්න
   b) ශාක වල පෙන්වන නයිට්‍රජන් ඌනතා ලක්ෂණ හතරක් ලියන්න.

ii. a) කොම්පෝස්ට් නිෂ්පාදන ක්‍රම හතරක් සඳහන් කරන්න.
   b) කොම්පෝස්ට් නිපදවීමට සුදුසු ස්ථානයක් තෝරා ගැනීමේදී සැලකිය යුතු කරුණු දෙකක් ලියන්න.

iii. a) බෝග වලට පොහොර යොදන අවස්ථා දෙකක් සඳහන් කරන්න.
   b) පොහොර භාවිත කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමේදී සැලකිල්ලට ගත යුතු කරුණු දෙකක් ලියන්න.

(07) බෝග වගාවේ පළිබෝධ පාලනය විධිමත් අයුරින් සිදුකිරීම මඟින් උසස් අස්වැන්නක් ලබාගැනීමට හැකිවේ.

i. a) බෝග වලට වල් පැළෑටි මඟින් සිදුවන හානි හතරක් ලියන්න.
   b) වල් පැළෑටි පාලන උපායමාර්ග දෙක මොනවා ද?



ii. a) ශාකයකට රෝගයක් වැළඳීමට සම්පූර්ණ විය යුතු සාධක තුන මොනවා ද?
   b) තවාන් පැළවලට බහුලව වැළඳෙන දිලීර රෝගයක් නම් කර, එහි රෝග ලක්ෂණයක් හා පාලන ක්‍රමයක් සඳහන් කරන්න.

iii. a) රූපයේ සිටින පළිබෝධකයා නම් කරන්න.
   b) මෙම පළිබෝධකයා බහුලව හානි පමුණුවන බෝග අයත් වන ශාක කුල දෙකක් ලියන්න.
   c) මෙම පළිබෝධකයාගේ හානිය සිදුවන ආකාරය කෙටියෙන් දක්වන්න.

පිළිතුරු පත්‍රය - I කොටස

1 - (2)	11 - (2)	21 - (2)	31 - (3)
2 - (3)	12 - (4)	22 - (4)	32 - (2)
3 - (1)	13 - (4)	23 - (3)	33 - (4)
4 - (2)	14 - (2)	24 - (4)	34 - (3)
5 - (4)	15 - (4)	25 - (2)	35 - (2)
6 - (4)	16 - (3)	26 - (1)	36 - (1)
7 - (2)	17 - (1)	27 - (3)	37 - (4)
8 - (3)	18 - (2)	28 - (4)	38 - (2)
9 - (2)	19 - (4)	29 - (2)	39 - (3)
10 - (3)	20 - (3)	30 - (1)	40 - (1)

(නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින්)

(01) i. 10 ශ්‍රේණිය පෙළපොතෙහි 7 පිටුවේ සඳහන් කරුණු වලට අදාලව ලකුණු ලබා දෙන්න. (ල.½x4=02)

ii.
- සමකයේ සිට ඇති දුර
- මුහුදේ සිට ඇති දුර ප්‍රමාණය
- අභ්‍යන්තර ජලාශ පිහිටා තිබීම
- උච්චත්වය
- වන ගහනය
- මිනිස් ක්‍රියාකාරකම් (ල.½x4=02)

iii.
- අනිසි ලෙස බිම් සැකසීම
- සෝඩියම් ලවණ අධික වීම
- පාංශු බාදනය අධික වීම
- ජල වහනය දුර්වල වීම (ල.½x4=02)

iv. 10 ශ්‍රේණිය පෙළපොතෙහි 55 පිටුවේ සඳහන් කරුණු වලට අදාලව ලකුණු ලබා දෙන්න. (ල.½x4=02)

v.
- ප්‍රාථමික බිම් සැකසීමේදී :- පස් පිඬැලි කැපීම, පස පෙරළීම, පස මතුපිට ඇති වල්පැළෑටි හා කාබනික ද්‍රව්‍ය යට කිරීම
- යාන්ත්‍රික උපකරණ :- තැටි නගුළ, මෝල්බෝඩ් නගුළ, ජපන් පරිවර්ත්‍ය නගුළ (ල.½x4=02)

vi.
- බීජ සිටුවීමේදී අවශ්‍ය වන බීජ ප්‍රමාණයට වඩා අඩු බීජ ප්‍රමාණයකින් අවශ්‍ය පැළ සංඛ්‍යාව නිපදවා ගත හැකිය.
- ඍජුවම ක්ෂේත්‍රයේ සිටුවීමට අපහසු කුඩා බීජ වලින් පැළ නිපදවා ගත හැකිවීම.
- කුඩා කල පැළවලට ආරක්ෂාව ලබා දිය හැකි වීම.
- රෝපණය සඳහා නිරෝගී ශක්තිමත් පැළ පමණක් තෝරාගත හැකි වීම.
- පැළ කුඩා කාලයේදී අහිතකර පාංශු හා පරිසර තත්ත්ව වලින් සිදුවිය හැකි හානි අවම කර ගැනීම. (ල.½x4=02)

vii. 10 ශ්‍රේණිය පෙළ පොතෙහි 103 පිටුවේ සඳහන් කරුණු වලට අදාලව ලකුණු ලබා දෙන්න. (ල.½x4=02)

viii. පොස්පරස් ඌනතා ලක්ෂණ :-
- ශාකයේ වර්ධනය බාලවේ.
- පත්‍ර පහසුවෙන් හැලේ.
- මුල් සංඛ්‍යාව අඩුවී වර්ධනය බාල වේ.
- සමහර ශාකවල මේරූ පත්‍ර දම්පාට වේ. (ල.½x4=02)

ix.
- සම්පූර්ණ රූපාන්තරණය :- පුරුක් පණුවා, ගොප් මැස්සා, ගොඩවෙල්ලා
- අසම්පූර්ණ රූපාන්තරණය :- ගොයම් මකුණා, පස්මුළු මකුණා, කීඩෑවා (ල.½x4=02)

x. 10 ශ්‍රේණිය පෙළ පොතෙහි 174 පිටුවේ සඳහන් කරුණු වලට අදාලව ලකුණු ලබාදෙන්න. (ල.½x4=02)

(මුළු ලකුණු 20)

(02) i. a) A - වියළි කලාපය - 1750 mm අඩු
B - අතරමැදි කලාපය - 1750 - 2500 mm අතර
C - තෙත් කලාපය - 2500 mm හෝ ඊට වැඩි (ල.½x2=02)

b) අතරමැදි කලාපයට - 20 (ල.½x2=02)

ii. a)
- මෝසම්
- සංවහන
- වාසුලි (ල.½x3=1½)

b) 10 ශ්‍රේණිය පෙළ පොතෙහි 27 පිටුවේ සඳහන් කරුණු වලට අදාලව ලකුණු දෙන්න. (ල.½x3=1½)

iii. a) සූර්ය විකිරණ මානය - ඒකකය ලක්ස් (Lux) (ල.½x2=1)

b) 10 ශ්‍රේණිය පෙළ පොතෙහි 30 පිටුවේ සඳහන් කරුණු වලට අදාලව ලකුණු දෙන්න. (ල.½x4=2)

(මුළු ලකුණු 10)

(03) i. a) පාෂාණ $\xrightarrow{\text{පාෂාණ ජීර්ණය}}$ මාතෘ ද්‍රව්‍ය $\xrightarrow{\text{පාංශු ජනනය}}$ පස (ල.½x3=1½)

b) වැලි, මැටි, රොන්මඩ (ල.½x3=1½)

ii. a)
- බීජ ප්‍රරෝහණයට හා මූල මණ්ඩලවල පාංශු වාතයේ අඩංගු O_2 වායුව අවශ්‍ය වේ.
- පාංශු ජීවීන්ගේ ස්වසනයට පාංශු වාතය අවශ්‍ය වේ.
- කාබනික ද්‍රව්‍ය වියෝජනයට උපකාරී වේ.
- පාංශු ජනනය සඳහා උපකාරී වේ. (ල.½x3=1½)

b) ගුරුත්වාකර්ෂණ ජලය / කේශාකර්ෂණ ජලය / ජලාකර්ෂණ ජලය (ල.½x3=1½)

iii. a) • පාංශු වයනය • පාංශු ව්‍යුහය • පාංශු වර්ණය • පාංශු ගැඹුර (ල.½x3=1½)

b)
- කාබනික ද්‍රව්‍ය වියෝජනය කරයි. (දිලීර, බැක්ටීරියා)
- පස මිශ්‍ර කරයි. (ගැඩවිලි පණුවන්)
- ඇලෙන සුලු ද්‍රව්‍ය පිටකිරීම නිසා පාංශු කැටිති ඇතිවීම පහසු කරයි.
- නයිට්‍රජන් තිර කරයි. (ල.½x4=2)

(මුළු ලකුණු 10)

(04) i. a) කොකු නඟුල (දැති පෝරුව) (ල.01)

b) ද්විතියික බිම් සැකසීම සඳහා (ල.01)

c) බෝගයක් ක්ෂේත්‍රයේ සංස්ථාපනය කිරීමෙන් පසු පස සම්භන්ධව සිදුකරන විවිධ ක්‍රියාකාරකම් අතුරුයත් ගෑම ලෙස හඳුන්වයි. (ල.½x2=1)

d)
- වල් මර්ධනය
- පැළ අවට පස් බුරුල් කිරීම
- පසට පොහොර මිශ්‍ර කිරීම
- පැළයේ මුලට පස් එකතු කිරීම
- කානු වල පස් ඉවත්කිරීම (ල.½x2=1)

ii. a)
- ගොයම් පැළ සිටුවීමේ යන්ත්‍රය
- මඩ වී බීජ ව්‍යාප්තිය
- ගොඩ බීජ ව්‍යාප්තිය (ල.½x2=1½)

b) 10 ශ්‍රේණිය පෙළපොතෙහි 71 පිටුවේ සඳහන් කරුණු වලට අදාලව ලකුණු ලබා දෙන්න. (ල.½x4=02)

iii. a) 10 ශ්‍රේණිය පෙළපොතෙහි 79 පිටුවේ සඳහන් කරුණු වලට අදාලව ලකුණු ලබා දෙන්න. (ල.½x3=1½)

b)
- සූර්ය තාපය මගින්
- පිළිස්සීම මගින්
- උණු ජලය යෙදීම මඟින්
- රසායනික ද්‍රව්‍ය භාවිතයෙන් (ල.½x3=1½)

(මුළු ලකුණු 10)

(05) i. a)
- පසට කාබනික ද්‍රව්‍ය එකතු කිරීම.
- පසට වසුන් යෙදීම.
- මල් පැළෑටි ඉවත් කිරීම.
- මතුපිටින් ඉවතට ගලාවන ජලයට බාධා කිරීම.
- පළතුරු හා විසිතුරු ශාක වල අනවශ්‍ය අතු හා පත්‍ර ඉවත් කිරීම. (ල.½x2=1)

b)
- මූලික වියදම අඩු ය.
- විශේෂ තාක්ෂණික දැනුමක් අවශ්‍ය නොවේ.
- වල් පැළ වර්ධනය සඳහා ද සුදුසු ක්‍රමය කි.
- පසේ ලවණතාවය ඉවත්කිරීමට ද සුදුසු ක්‍රමයකි. (ල.½x4=2)

ii. a)
- බිංදු ජල සම්පාදනය
- විසිරුම් ජලසම්පාදනය (ල.½x2=1)

b)
- මූලික වියදම වැඩිය.
- තාක්ෂණික දැනුම අවශ්‍ය වේ.
- නළ පද්ධති අවහිර විය හැකිය.
- අතුරුයත් ගැමේදී අපහසුතා ඇතිවේ. (ල.03)

iii. a) වගා භූමි වල ඇති අතිරික්ත ජලය හෙවත් ක්ෂේත්‍ර ධාරිතාවෙන් ඔබ්බට ඇති ජලය ක්ෂේත්‍රයෙන් බැහැර කිරීම. (ල.01)

b) 10 ශ්‍රේණිය පෙළපොතෙහි 107 පිටුවේ සඳහන් කරුණු වලට අදාලව ලකුණු ලබා දෙන්න. (ල.½x4=02)

(මුළු ලකුණු 10)

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

(06) i. a) සින්ක්, කොපර්, මැංගනීස්, මොලිබ්ඩිනම්, බෝරෝන්, යකඩ, ක්ලෝරීන් (ල.½x4=2)

b) • මේරූ පත්‍ර කහපාට වේ. • වර්ධනය අඩුවී ශාක කුරු වේ.
• මල් සහ ඵල විකෘති වේ. • අස්වැන්න අඩුවේ. (ල.½x4=2)

ii. a) • ගොඩ ක්‍රමය • වළ ක්‍රමය
• කෝටු රාමු ක්‍රමය • බැරල් ක්‍රමය (ල.½x4=2)

b) • නිවාස, ලිං ආදියෙන් ඈත් වූ ස්ථානයක් වීම.
• ප්‍රවාහන පහසුකම් සහිත වීම.
• අමුද්‍රව්‍ය පහසුවෙන් සපයාගත හැකි ස්ථානයක් වීම.
• ජල පහසුකම් සහිත ස්ථානයක් වීම.
• වර්ෂාකාලයේ ජලයෙන් යට නොවන ස්ථානයක් වීම. (ල.½x2=1)

iii. a) • මූලික පොහොර යෙදීම • මතුපිට පොහොර යෙදීම (ල.½x2=1)

b) 10 ශ්‍රේණිය පෙළපොතෙහි 125 පිටුවේ සඳහන් කරුණු වලට අදාලව ලකුණු ලබා දෙන්න. (ල.½x2=1)

(මුළු ලකුණු 10)

(07) i. a) 10 ශ්‍රේණිය පෙළපොතෙහි 131-132 පිටුවේ සඳහන් කරුණු වලට අදාලව ලකුණු ලබා දෙන්න. (ල.½x4=2)

b) • වගාබිම් තුළ තිබෙන වල් පැළෑටි බෝගයට හානි සිදුකළ හැකි මට්ටමට අඩුවෙන් පවත්වා ගැනීම.
• වගා භූමියට අලුතින් වල් පැළෑටි ඇතුළු වීම වැළැක්වීම. (ල.02)

ii. a) • රෝග කාරකයා • ධාරක ශාකය රෝග • කාරකයාට හිතකර පරිසරය (ල.½x3=1½)

b) • දියමලන් කෑම
• 10 ශ්‍රේණිය පෙළපොතෙහි 148 පිටුවේ සඳහන් කරුණු වලට අදාලව ලකුණු ලබා දෙන්න. (ල.½x3=1½)

iii. a) එපිලැක්නා කුරුමිණියා (ල.1)

b) • සොලනේසියේ • කුකර්බිටේසියේ (ල.½x2=1)

c) • සුනුඹුල් කුරුමිණියන් පත්‍ර කා දැමූ විට එම ප්‍රදේශය දැලක් මෙන් දිස්වේ.
• කීටයන්ද පත්‍රවලට හානි පමුණුවයි. සමහර අවස්ථාවල මල් හා ලපටි ඵල වලටද හානි පමුණුවයි. (ල.1)

(මුළු ලකුණු 10)

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank